# පුරප්පාඩු දැන්වීමයි

# මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ

# පළාත් අධ්‍යක්ෂ තනතුර

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මධ්‍යම පළාත් සභාවේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා පත් කිරීමට ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I පන්තියට අයත් දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි, සේවයේ නියුතු සුදුසු නිලධරයන් වෙතින් අයැදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයට අයත් අයැදුම්කරුවන් අතුරින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත පුරප්පාඩු තනතුර සඳහා බඳවා ගනු ලැබේ. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා තිබීම, සේවා කාලය, විෂයානුබද්ධ දැනුම, පරිපාලනමය හැකියාව හා අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලනු ලැබේ.

මෙම තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේ නිර්ණායක පහත පරිදි වේ.

ලකුණු ලබාදීමේ නිර්ණායක (උපරිම ලකුණු 100 කි)

| | | |
|---|---|---|
| I. | ජ්‍යෙෂ්ඨතාවය | - ලකුණු 40 |
| II. | මූල්‍ය කළමනාකරණය | - ලකුණු 10 |
| III. | සංවර්ධන කටයුතු පිළිබඳ අවබෝධය | - ලකුණු 15 |
| IV. | පරිපාලන කටයුතු පිළිබඳ දැනුම | - ලකුණු 10 |
| V. | පශ්චාත් උපාධි | - ලකුණු 05 |
| VI. | ප්‍රකාශන<br>විශේෂ ව්‍යාපෘති | - ලකුණු 05 |
| VII. | පසුගිය වසර 05 තුළ කාර්ය සාධනය පදනම් කරගෙන | |
| | a. ඉතා හොඳයි | - 3 x 5 - ලකුණු 15 |
| | b. හොඳයි | - 2 x 5 - ලකුණු 10 |
| | c. සාමාන්‍යයි | - 1 x 5 - ලකුණු 05 |

02. අවශ්‍ය සුදුසුකම්

i. පශු වෛද්‍ය විද්‍යා උපාධියක් සහිත ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පළමු ශ්‍රේණියේ වසර 03ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරියෙකු වීම.

ii. 2016.07.11 දිනට ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයට අයත් නිලධරයෙකු ලෙස අවම වශයෙන් වසර 10 සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

iii. කිසිදු විනය කටයුත්තකට හෝ විනය දඬුවමකට භාජනය නොවූ අයෙකු විය යුතුය.

iv. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයැදුම්පත් කැඳවනු ලබන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

v. අයැදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

**සටහන :- සුදුසුකම් සනාථ කෙරෙන සියළුම සහතිකවල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයැදුම්පත සමඟ අමුණා එවිය යුතුය.**

03. අයැදුම්පත් ඉදිරිපත් කිරීම

සියළුම අයැදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2016 ජුලි මස 11 දිනට හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයැදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය) "ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර." යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයැදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ තනතුර සඳහා අයැදුම්පත් කැඳවීම"** යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයැදුම්පත්, අසම්පූර්ණ අයැදුම්පත් හා අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයැදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයැදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම ගැන කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ (ආදර්ශ අයැදුම්පත www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය).

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය සතු වේ.

මෙම දැන්වීමේ සිංහල හා දෙමළ පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

2016 ජූනි මස 24 වැනි දින.
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලයේදීය

ආර්.එම්.එන්. රත්නායක,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව